10 NOV 2014
STUDIES
OF KELANIYA

# වාග්විද්‍යා දර්ශනපති නිබන්ධිකාව

## ඉංග්‍රීසි භාෂක සමාජයක දී සංක්‍රමණික වැඩිහිටි සිංහල භාෂකයකු ඉංග්‍රීසි භාෂාව දෙවන භාෂාව ලෙස ව්‍යවහාර කිරීමේ දී මුහුණ දෙන ශබ්ද උච්චාරණයට අදාළ ගැටලු පිළිබඳ වාග්විද්‍යාත්මක අධ්‍යයනයක්

පැනහැටිපොළ මුදියන්සේලාගේ තුෂාරී සංජීවනී කරුණාරත්න
( විශේෂ ශාස්ත්‍රවේදී ගෞරව )

ප්‍රවේශ අංකය: 923
වර්ග අංකය:

වාග්විද්‍යා අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර පීඨය
දෙසැම්බර් 2011

FGS/04/02/04/2005/03

# සාර සංග්‍රහය

ඉංග්‍රීසි භාෂක සමාජයක දී සංක්‍රමණික වැඩිහිටි සිංහල භාෂකයකු ඉංග්‍රීසි භාෂාව දෙවන භාෂාව ලෙස ව්‍යවහාර කිරීමේ දී මුහුණ දෙන ශබ්ද උච්චාරණයට අදාළ ගැටලු පිළිබඳ ව මෙකී පර්යේෂණය මගින් අධ්‍යයනය කරන ලදි. සිංහල භාෂකයකු ඉංග්‍රීසි භාෂාවෙහි වචන උච්චාරණය කිරීමේ දී ඝණ්ඨිය ශබ්ද සහ අඝණ්ඨිය ශබ්දයන්හි භාෂාමය ගැටලු ඇති කරන්නේ ද?, එම ගැටලුවල ස්වරූපය සහ විවිධතා කෙබඳු ද?, වැඩිහිටි සංක්‍රමණික භාෂකයන් එම ගැටලු මග හරවා ගෙන තිබේ ද? යන්න පිළිබඳ ව මෙහි දී පර්යේෂණයට යොමු විය. දත්ත විශ්ලේෂණයෙහි දී යොදා ගත් වර්ණාවලී ලේඛන සටහන් සහ ශබ්ද තරංග රූප සටහන් අඝණ්ඨිය ලක්ෂණයන්හි පිහිටවා විශ්ලේෂණය කරන ලදි. දත්ත විශ්ලේෂණයෙහි දී සිංහල භාෂකයකු ඉංග්‍රීසි භාෂක සමාජයක දී ඉංග්‍රීසි උච්චාරණය සමග සමානත්වයක් නොදක්වන බවත්, මව් භාෂාවෙහි පුරුදු දෙවන භාෂාව උච්චාරණය කෙරෙහි බලපෑමක් සිදුකරන බවත්, මව් භාෂාවෙහි නොමැති ශබ්ද සඳහා ඊට සමාන ස්වරූපයක් ඇති ස්වභාෂා ශබ්ද ආදේශ කර උච්චාරණය කිරීමක් වැඩිහිටි සිංහල භාෂකයකු අතින් සිදු කෙරෙන බවත් පර්යේෂණ දත්ත අනුව පැහැදිලි විය. මෙම පර්යේෂණ නිබන්ධයේ පළමු පරිච්ඡේදය හැඳින්වීම සඳහා වෙන් වන අතර අධ්‍යයනයේ පසුබිම, අරමුණු, අන්තර්ගතය, පරිච්ඡේද සැලැස්ම සහ පර්යේෂණ ක්‍රමවේදය යටතෙහි පර්යේෂණයෙහි සීමාවන් සහ දත්ත රැස් කිරීමේ දී මතුවන ගැටලු පිළිබඳ ඉදිරිපත් කරනු ලැබේ. දෙවන පරිච්ඡේදය ඕස්ට්‍රේලියානු ඉංග්‍රීසි භාෂණයෙහි ස්වර සහ සංයුක්ත ස්වර ශබ්ද සහිත වචන උච්චාරණය කිරීමේ දී මතු වන ගැටලු සහ උච්චාරණ විවිධතා පිළිබඳ ව කරන විග්‍රහයකි. තුන්වන පරිච්ඡේදයෙන් ව්‍යඤ්ජන ශබ්ද උච්චාරණයෙහි මතු වන ගැටලු සහ උච්චාරණ විවිධතා පිළිබඳ ව විස්තර කරනු ලැබේ. අඝණ්ඨිය ශබ්ද ලක්ෂණවලට අදාළ කරුණු පිළිබඳ විස්තර සටහනක් හතරවන පරිච්ඡේදයෙන් සහ පස් වන පරිච්ඡේදයෙන් ඉදිරිපත් කරනු ලබන අතර එහි දී ස්වර සහ සංයුක්ත ස්වර ශබ්දයන්හි ආයාමය, ස්වරණය සහ ඝාතයට අදාළ  ස්ත්‍රී පුරුෂ විෂයෙන් ගැටලු ඇති වන අවස්ථා කිහිපයක් පිළිබඳ තුලනාත්මක විශ්ලේෂණයක් හතරවන පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරෙයි. ශබ්ද තරංග රූප සටහන් අනුසාරයෙන් ව්‍යඤ්ජන ශබ්දයන්හි ආයාමය, ස්වරණය සහ ඝාතයට අදාළ උච්චාරණ විවිධතා පිළිබඳ ව විස්තරයක් පස්වන පරිච්ඡේදයට ඇතුළත් කරන ලදි. සයවන පරිච්ඡේදයෙන් සාරාංශය, අවසාන නිගමන සහ අනාගතයේ දී ඉංග්‍රීසි භාෂණයෙහිලා සිංහල භාෂකයන්හට මතුවන ගැටලු අවම කිරීම සඳහා යෝජනා ද ඉදිරිපත් කරනු ලැබේ. මෙකී පර්යේෂණය ඉංග්‍රීසි භාෂක සමාජයකට සංක්‍රමණය වන සිංහල භාෂකයන්හට මෙන් ම සිංහල භාෂක සමාජයෙහි ඉංග්‍රීසි භාෂාව උපාර්ජනය කරන්නා වූ නිවේදකයන්හට ද භාෂා උපාර්ජන ගැටලු අවම කර ගැනීම සඳහා උපකාරී වන්නකි. එමගින් වාග්විද්‍යා පර්යේෂකයන්හට මෙකී පර්යේෂණ නිබන්ධය විෂය අධ්‍යයනයක් බවට පත් වනු ලැබෙයි.